සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

27-02-2024

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

28C54

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි.

- පළමුවන ප්‍රශ්නය ඇතුලුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. ලංකා ජාත්‍යන්තර හෝටල් පාසලේ ආහාරපාන පිළියෙල කිරීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ කමිතු පෙරේරා සංචාරක හෝටලයක වසර හතරක් සේවය කළේ ය. තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළ ඔහු කර්මාන්තපුරයක් පිහිටි තම නිවස ආසන්නයේම ගොඩනැගිල්ලක් මාසිකව රු: 30,000ක කුලියට ගෙන තමා ඉතිරිකරගෙන තිබූ රු: 700,000ක් ද, රු: 1,300,000ක් වටිනා තම මෝටර් රථය ද යොදවා ''කමිතු රෙස්ටුරන්ට්'' නමින් ආහාර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2023 ජනවාරි 01 දින ආරම්භ කළේ ය.

තමා සමඟ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ සමිතු පෙරේරා මාසිකව රු: 50,000ක වැටුපකට කළමනාකරුවකු ලෙස ද, තවත් සේවකයින් දෙදෙනෙකු ද එදින ම ව්‍යාපාරයට බඳවා ගත් අතර, රු: 400,000 ක බැංකු ණයක් ද ලබා ගෙන ව්‍යාපාරයට යෙදවිය. රු: 100,000 ක ආහාර පිළියෙල කිරීමේ උපකරණ ද එදින මිලදී ගන්නා ලදී.

ජනවාරි මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| ආහාර ද්‍රව්‍ය මිලදී ගැනුම් | රු: 75,000 |
| විදුලි ගාස්තු | රු: 5,000 |
| සේවක වැටුප් | රු: 40,000 |
| කළමණාකරුගේ වේතනය | රු: 50,000 |
| ප්‍රවාහන වියදම් | රු: 10,000 |
| විකුණුම් ආදායම් | රු: 300,000 |

ව්‍යාපාරය දිනෙන් දින දියුණුවට පත්වන බැවින් නීතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාරයක් බවට ''කමිතු රෙස්ටුරන්ට්'' පත්කිරීමට ද කමිතු අදහස් කරයි.

- ඉහත තොරතුරු ඇසුරෙන් අංක i සිට x දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. අ. මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ල. 1)
   ආ. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් ලියන්න. (ල. 1)

ii. අ. ''කමිතු රෙස්ටුරන්ට්'' සපුරාලන මිනිස් අවශ්‍යතාවය කුමක් ද? (ල. 1)
   ආ. ව්‍යාපාරයේ කළමනාකරු ලෙස සමිතු පෙරේරාගෙන් ව්‍යාපාරයට බලාපොරොත්තුවන දායකත්වයන් දෙකක් ලියන්න. (ල. 2)

iii. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න. (ල. 2)

iv. අ. මෙම ව්‍යාපාර සංවිධානයේ වාසියක් සහ අවාසියක් ලියන්න. (ල. 1)
   ආ. කමිතුගේ අදහසට අනුව ඔහු විසින් ආරම්භ කළ යුතු නව ව්‍යාපාර සංවිධානය කුමක් ද? (ල. 1)

v. 2023. 01. 01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න. (ල. 2)

vi. "කමිතු රෙස්ටුරන්ට්" ව්‍යාපාරය භාවිතා කරන මූලික පොතක් නම් කර ඊට අදාළ මූලාශ්‍ර ලේඛණය ලියන්න. (ල. 2)

vii. අ. මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනුවක් ලියන්න. (ල. 1)

ආ. ව්‍යාපාරයේ 2023. 01. 31 දිනට වගකීම් කොපමණ ද? (ල. 1)

viii.. බැංකු ණයක් ලබා ගැනීමට අදාල වටිනාකම් සහිතව ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 2)

ix. 2023. 01. 31 දිනට ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණ ද? (ල. 2)

x. ඉහත ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කමක් හා ජංගම නොවන වගකීමක් වටිනාකම් සහිතව දක්වන්න. (ල. 2)

(මුළු ලකුණු 20)

## I - කොටස

### ව්‍යාපාර අධ්‍යයනය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

02. i. අ. මූලික මිනිස් අවශ්‍යතා දෙකක් නම් කර ඊට අදාළ වුවමනා ද දෙක බැගින් ලියන්න. (ල. 1)

ආ. ව්‍යාපාරවල දැකිය හැකි අරමුණු දෙකක් ලියන්න. (ල. 1)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

අ. අත්‍යවශ්‍ය වීම වුවමනා වල ලක්ෂණයකි. (................)

ආ. ව්‍යාපාරයේ අනාගත වර්ධනය ව්‍යාපාරයක කළමණාකරුවකුගේ අරමුණකි. (................)

ඉ. අල්මාරි නිෂ්පාදනය කිරීම සේවා ව්‍යාපාරයකි. (................)

ඊ. රැකියා අවස්ථා උත්පාදනය රජය ව්‍යාපාරවලින් බලාපොරොත්තු වන අරමුණකි. (................)

(ල. 2)

iii. අ. අවශ්‍යතා හා වුවමනා වල දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න. (ල. 1)

ආ. භාණ්ඩ හා සේවා අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල. 1)

iv. අ. තරගකරුවන් ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන්නේ කෙසේ ද යන්න උදාහරණයක් දක්වන්න. (ල. 1)

ආ. පාසල නමැති ආයතනය කෙරෙහි ඇල්මැති පාර්ශ්වයක් නම් කර එම පාර්ශ්වය ඇල්මක් දැක්වීමට හේතුව නම් කරන්න. (ල. 1)

(මුළු ල. 08)

03. i. අ. අභ්‍යන්තර පරිසර සාධක දෙකක් නම් කරන්න. (ල. 1)

ආ. රජය විසින් අණපනත් හා නීතිරීති පැනවීමේ අරමුණු දෙකක් ලියන්න. (ල. 1)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

අ. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සැලකිලිමත් වෙමින් ව්‍යාපාරිකයන් තම ව්‍යාපාර කටයුතු මෙහෙයවිය යුතුය. (................)

ආ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවීම මුළු ලෝකයම විශ්ව ගම්මානයක් වීමට හේතු විය. (................)

ඉ. ව්‍යාපාරික අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් තර්ජන සඳහා සාර්ථකව මුහුණ දීමටත් ව්‍යාපාරිකයා ක්‍රියා කළ යුතුය. (................)

ඊ. දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවරවීම ගෝලීය පරිසරය නිසා සිදු වූ හිතකර බලපෑමක් වේ. (................)

(ල. 2)

iii. අ. ව්‍යාපාර කටයුතු සඳහා තාක්ෂණය භාවිතා කරන අවස්ථා දෙකක් දක්වන්න. (ල. 1)

ආ. සංස්ථාපිත සමාගම්වල වාසි දෙකක් ලියන්න. (ල. 1)

iv. අ. හවුල් ව්‍යාපාරයකට ලිඛිත ගිවිසුමක් අනිවාර්ය වන්නේ කුමන අවස්ථාවකදී ද? (ල. 1)

ආ. දෙපාර්තමේන්තුවක වාසි දෙකක් ලියන්න. (ල. 1)

(මුළු ල. 08)

04. i. අ. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වරූපය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන්න. (ල. 1)

ආ. අරමුණක් අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ප්‍රධාන ආකාර දෙක උදාහරණ සහිතව දක්වන්න. (ල. 1)

ii. පහත සඳහන් ප්‍රකාශය සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

අ. රජයෙන් ලබාදෙන දිරිගැන්වීම් ලබා ගැනීමට ව්‍යාපාර ලියාපදිංචි කර තිබීම සුදුසුකමක් වේ. (................)

ආ. වාර්ෂික රාජ්‍ය අයවැය ලේඛනය මගින් රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා අරමුදල් ප්‍රතිපාදනය කරයි. (................)

ඉ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය රාජ්‍ය සංස්ථාවකි. (................)

ඊ. සංස්ථාපිත සමාගමක කොටස්කරුවන් මිලදී ගත් කොටස්වල වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමා වේ. (................)

(ල. 2)

iii. ත්‍රිකුණාමල ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් 15 දෙනෙකු ස්වේච්ඡාවෙන් එකතු වී ධීවර නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමේ අරමුණින් ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය වන ස්වාධීන සංවිධානයක් ආරම්භ කිරීමට අදහස් කරයි.

අ. ඉහත සිද්ධියේ ධීවරයින් ආරම්භ කිරීමට අදහස් කරන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? ඊට බලපාන පනත නම් කරන්න. (ල. 1)

ආ. ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් හා අවාසියක් බැගින් ලියන්න. (ල. 1)

iv. ජානකී රත්නායක විසින් පවත්වාගෙන යන "ජානී සැලොන්" ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට ඇය අදහස් කරයි.

අ. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ බලධාරියා නම් කරන්න. (ල. 1)

ආ. මෙය ලියාපදිංචි කිරීමේදී ඉදිරිපත් කළ යුතු ලියකියවිලි දෙකක් නම් කරන්න. (ල. 1)

(මුළු ල. 08)

## II කොටස
## ගිණුම්කරණය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

05. i. අ. ව්‍යාපාරයක හිමිකම යනු කුමක් ද?

ආ. හිමිකම් ගිණුම්වලට අදාල ද්විත්ව සටහන් මූලධර්මය ලියන්න. (ල. 2)

ii. පහත සඳහන් වත්කම් ජංගම වත්කමක් ද, ජංගම නොවන වත්කමක් ද, යන්න සඳහන් කරන්න.

අ. ලී බඩු හා උපකරණ | ආ. ණයගැතියෝ

ඉ. විකිණීමට තබාගෙන ඇති භාණ්ඩ තොග | ඊ. යන්ත්‍රෝපකරණ (ල. 2)

iii. නිමි ඇඳුම් අලෙවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන විලාසිතා ගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසය තුළ සිදුවී ඇති ගනුදෙනු වලින් ගිණුම්කරණ සමීකරණයට වූ බලපෑම පහත පරිදි දක්වා ඇත.

| | වත්කම් | | | | = හිමිකම | + වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | උපකරණ | ණය ගැතියෝ | භාණ්ඩ තොගය | මුදල් | හිමිකම | බැංකු ණය | ණයහිමියෝ |
| 01/01 ශේෂය | 150,000 | 25,000 | 75,000 | 50,000 | 175,000 | 100,000 | 25,000 |
| 01. 05 | | | + 10,000 | | | | +10,000 |
| 01. 12 | | + 15,000 | - 12,000 | | + 3,000 | | |
| 01. 18 | | | | - 15,000 | | - 15,000 | |
| 01. 23 | | | | - 10,000 | | | - 10,000 |
| 01. 31 ශේෂය | 150,000 | 40,000 | 73,000 | 25,000 | 178,000 | 85,000 | 25,000 |

අවශ්‍ය වන්නේ එක් එක් දිනයේ සිදු වී ඇති ගනුදෙනුව අගයන් සහිතව දැක්වීම. (ල. 4)

iv. අ. පහත සඳහන් ගනුදෙනුවලට අදාල ද්විත්ව සටහන් ලියන්න.

1. රු: 25,000 ක භාණ්ඩ ණයට ගැනීම
2. රු: 5,000ක බැංකු ණය පොළී මුදලින් ගෙවීම.

ආ. පහත ද්විත්ව සටහන් වලට අදාළ ගනුදෙනු ලියන්න. (ල. 2)

1. මෝටර් රථ ගිණුම හර 500,000
   ප්‍රාග්ධන ගිණුම බැර 500,000
2. මුදල් ගිණුම හර 6,000
   ණයගැති ගිණුම බැර 6,000 (ල. 2)

(මුළු ල. 12)

06. i. අ. මූලාශ්‍ර ලේඛණ යනු කුමක් ද?

ආ. මූලාශ්‍ර ලේඛණයක අන්තර්ගත කරුණු දෙකක් ලියන්න. (ල. 2)

ii. අ. මුදල් වට්ටම් යනු කුමක් ද?

ආ. දුන් වට්ටම්වලට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ල. 2)

iii. අලංකාරගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසය සඳහා පිළියෙල කළ සුළු මුදල් පොත පහත දක්වේ.

සුළු මුදල් පොත

| ලැබීම් රු: | ස. පි. | දිනය | විස්තරය | වවු. අ. | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු ගමන් රු. | සංග්‍රහ රු. | ලිපිද්‍රව්‍ය රු. | ලෙජර් ගිණුම රු. | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 70 | | 1/1 | ශේෂය ඉ/ගෙ | | | | | | | |
| .......... | | 1/1 | මුදල් | | | | | | | |
| | | 1/5 | ත්‍රිවීල් ගාස්තු | 01 | 200 | 200 | | | | |
| | | 1/8 | සිසිල් පැන් | 02 | 300 | | 300 | | | |
| | | 1/12 | වෑන්රථ කුලී | 03 | 400 | 400 | | | | |
| | | 1/18 | A4 කඩදාසි | 04 | 500 | | | 500 | | |
| | | 1/24 | කුමාරට ගෙවීම් | 05 | 250 | | | | 250 | |
| | | 1/27 | තේ පැන් සඳහා | 06 | 150 | | 150 | | | |
| | | | | | 1800 | 600 | 450 | 500 | 250 | |
| | | 1/31 | ශේෂය ප /ගෙ | | 200 | | | | | |
| 2000 | | | | | 2000 | | | | | |
| 200 | | 2/1 | ශේෂය ඉ / ගෙ | | | | | | | |

අවශ්‍ය වන්නේ

අ. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම දැක්වීම.

ආ. 2023. 02. 01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල දැක්වීම.

ඉ. ඉහත සුළු මුදල් ගෙවීම්වලට අදාල තොරතුරු ලෙජර් ගිණුම්වල දක්වීම. (ල. 4)

24-02-2024 G. 10

iv. නන්දනගේ ව්‍යාපාරයේ 2023. 05. 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රුː 17,000ක් විය. නමුත් මැයි මාසය සඳහා බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය, බැංකු ගිණුමේ ශේෂය හා නොගැළපුණි. පසුව වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.

- ස්ථාවර නියෝග මහ බැංකුව විසින් ගෙවා ඇති ලීසිං වාරිකය රුː 6,000කි.
- බැංකුවට සෘජුවම ලැබී ඇති ණය ගැති ප්‍රේෂණ රුː 8,000කි.
- තැන්පත්කළ නමුත් මැයි මාසය තුල නිෂ්කාශනය නොවූ චෙක් පත් රුː 5,000කි.
- නිකුත්කළ නමුත් මැයි මාසය තුළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රුː 7,000 කි.

අවශ්‍ය වන්නේ,

අ. 2023. 05. 31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම. (ල. 4)

ආ. 2023. 05. 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම. (මුළු ල. 12)

07. i. අ. ටෙලි බැංකු සේවා තුළින් ව්‍යාපාරිකයෙකුට ඉටුකර ගත හැකි කාර්‍යයන් දෙකක් ලියන්න.

ආ. ජංගම දුරකථන බැංකුකරණයේ වාසි දෙකක් ලියන්න. (ල. 2)

ii. අ. ව්‍යාපාරයේ බැංකු ගිණුම අයත්වන ගිණුම් වර්ගය කුමක් ද?

ආ. බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛණ දෙකක් ලියන්න. (ල. 2)

iii. විශාකාගේ ව්‍යාපාරයේ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | වටිනාකම (රු) |
|---|---|---|---|
| 2023. 12. 02 | 0625 | කුමාරසිංහ | 20,000 |
| 2023. 12. 14 | 0626 | සමරසිංහ | 24,000 |
| 2023. 12. 26 | 0627 | අමරසිංහ | 28,000 |

Resource Center R De Mazenod College Kandana

අවශ්‍ය වන්නේ,

අ. ඉහත ගණුදෙනු විශාකාගේ ව්‍යාපාරයේ විකුණුම් ජ'නලයේ සටහන් කිරීම.

ආ. 2023. 12. 31 දිනට විකුණුම් ජ'නලයේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම. (ල. 4)

iv. අ. ගිණුම්කරණ ක්‍රියාවලියේ දී වැරදි සිදුවිය හැකි අවස්ථා දෙකක් ලියන්න.

ආ. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේ දී සිදු වූ වැරදි කිහිපයකි.

A රුː 25,000ක ගැණුම් ඉන්වොයිසියක් ගිණුම්පොත් වලින් සම්පූර්ණයෙන් මඟ හැරී ඇත.

B ණය හිමියන්ට ගෙවූ රුː 7,000ක මුදල අදාළ ගිණුම් දෙකෙහිම හරට සටහන් වී ඇත.

C රුː 5,000ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වල දෙවරක් සටහන් වී ඇත.

D රුː 17,500ක වැටුප් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.

අවශ්‍ය වන්නේ,

1. ශේෂ පිරික්සුමේ සමානත්වයට බල නොපාන වැරදි (ල. 2)
2. ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරදි වෙන වෙනම දැක්වීම. (ල. 2)

(මුළු ල. 12)